විභාග - විභාග ප්‍රතිඵල ආදිය

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 03 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය - (MT -01) යටතේ මූලික තාක්ෂණ ශිල්පී තනතුරුවල III වන ශ්‍රේණියට විවෘත පදනමින් බඳවා ගැනීම සඳහා වන පුහුණු කාලයට බඳවා ගැනීම - 2026

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2017.09.07 දිනැතිව අනුමත කරන ලද ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 03 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය - (MT -01) ප්‍රකාරව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මූලික තාක්ෂණ ශිල්පී III වන ශ්‍රේණියේ තනතුරුවලට විවෘත පදනමින් බඳවා ගැනීම සඳහා වන පුහුණු කාලයට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026.12.14 දින වේ.

(2). මෙම විවෘත තරග විභාගය මඟින් බඳවා ගැනීම සිදු කරනුයේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 03 සේවා ගණයේ - (MT -01) මූලික තාක්ෂණ ශිල්පී III වන ශ්‍රේණියේ පහත සඳහන් තනතුරු සඳහා වන පුරප්පාඩු සඳහා යි.

අනු. අංකය	*තනතුර*	*පුරප්පාඩු ගණන*
01	මූලික තාක්ෂණ ශිල්පී (කම්බිකරු)	16
02	මූලික තාක්ෂණ ශිල්පී (වඩු)	129
03	මූලික තාක්ෂණ ශිල්පී (පෙදරේරු)	69
04	මූලික තාක්ෂණ ශිල්පී(පිංතාරු)	32
05	මූලික තාක්ෂණ ශිල්පී(බෙලෙක් වැඩ)	3
06	මූලික තාක්ෂණ ශිල්පී (පොරාදු)	4
07	මූලික තාක්ෂණ ශිල්පී (වාත්තු)	14
08	මූලික තාක්ෂණ ශිල්පී (ප්‍රගති)	11
09	මූලික තාක්ෂණ ශිල්පී(කම්මල්)	33
	එකතුව	311

සටහන - ඔබ විසින් සම්පූර්ණ කර ඇති, හදාරා ඇති පාඨමාලාවන් අනුව ඉහත සඳහන් කරන ලද තනතුරු 03 ක් සඳහා ප්‍රමුඛතාවයක් ලබා දී තනතුරු සඳහා ඉල්ලුම් කිරීමේ

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

හැකියාවක් ඔබට ඇත.එම ඉල්ලුම් කර ඇති තනතුරුවල ප්‍රමුඛතාවය අනුව ඔබට පත්වීම ලබා දෙන අතර කිසි විටක එම ප්‍රමුඛතාවය වෙනස් කිරීමට ඉඩ පහසුකම් ලබා දෙනු නොලැබේ.

3). **තනතුරුවලට අදාළ කාර්යයන්** :

අනු. අංකය	*තනතුර*	*තනතුරට පැවරෙන කාර්යයන්*
01	මූලික තාක්ෂණ ශිල්පී (කම්බිකරු)	දුම්රිය එන්ජින්, ගැල් හා මැදිරි, යන්ත්‍ර සූත්‍ර මෙවලම්, ඇතුළු ඒ ඒ උප දෙපාර්තමේන්තුවල අදාළ අළුත් වැඩියාවන් කිරීම, නිෂ්පාදනය කිරීම, ගැලවීම, සවි කිරීම, එකලස් කිරීම, යන සියළු කාර්යයන්හි තනතුරට අදාළ කටයුතු කිරීම,
02	මූලික තාක්ෂණ ශිල්පී (වඩු)	සියළුම එන්ජින්, මැදිරි, ගැල් හා යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීමේදී හා අළුත්වැඩියා කිරීමේදීත් කාර්යාල හා කර්මාන්තශාලා පවත්වාගෙන යාමේදී හා සියළුම ඉදිකිරීම් ක්ෂේත්‍රයන් සඳහා අවශ්‍ය වන උපකරණ හා උපාංග තැනීම, ලී බඩු හා උපකරණ තැනීම, ලී බඩු නිෂ්පාදනය කිරීම, මැදිරි තැනීම හා අළුත්වැඩියා කටයුතු ලී ඉරුම්හල් මගින් කෙරෙන ලී ඉරීම්, යතුගෑම, පුලුක්කු කිරීම, විදුරු කැපීම, හා සවි කිරීම, ඇතුළු සියළුම ආකාරයේ වඩු කාර්මික වැඩ කටයුතු කිරීම, හා උපකරණ නඩත්තු කිරීම සියළුම ආකාරයේ කියත් මුවහත් කිරීම හා අළුත්වැඩියාව
03	මූලික තාක්ෂණ ශිල්පී (පෙදරේරු)	දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලුම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පෙදරේරු කටයුතු හා දුම්රිය මැදිරිවල බිම් තට්ටුවේ සහ වැසිකිළි වලවල්වල සිමෙන්ති දැමීම ඇතුළු නියම කරනු ලබන වෙනත් පෙදරේරු කාර්යයන් ඉටු කිරීම
04	මූලික තාක්ෂණ ශිල්පී (පිංතාරු)	දුම්රිය එන්ජින්, ගැල්, මැදිරි, වාහන, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණවලද, කාර්යාල ලී බඩු, ගොඩනැගිලි, පාලම්, සංඥා උපකරණ හා වෙනත් උපකරණ අතින් හා ස්ප්‍රේ මගින් නිවැරදිව පින්තාරු කිරීම සහ සියළු ආකාරයේ පින්තාරු වැඩ කිරීම
05	මූලික තාක්ෂණ ශිල්පී (බෙලෙක් වැඩ)	දුම්රිය එන්ජින්, ගැල්, මැදිරි, වාහන, යන්ත්‍ර සූත්‍රවල නඩත්තු හා අලුත්වැඩියා කිරීම්වලදී අවශ්‍ය වන අමතර කොටස් නිෂ්පාදනය, ලෝහ සංයෝග, ඊයම් මිශ්‍රණ සංයෝග සෑදීම, පාස්සන ද්‍රව්‍යවල අමතර කොටස් කැපීම, යන්ත්‍රාගාර හා උපකරණ නඩත්තුව, ලෝහ ගල්වල හෝ පාස්සන ද්‍රව්‍යයන් නිසි පරිදි පිරිසිදු කර සවිකර අව්වු සාදාගැනීම, නොයෙක් ආකාරයේ හැඩ ඇති කොටස් අවශ්‍ය පරිදි වායුවෙන් ක්‍රියාකරන යන්ත්‍ර මගින් කපා ගැනීම හා කර්මාන්තශාලා නිලධාරීන් දෙන නියෝග අනුව කටයුතු කිරීම
06	මූලික තාක්ෂණ ශිල්පී(පොරාදු)	මැදිරි හා කාර්යාල පුටු, එන්ජින්වල ෂිට් කුෂන් කිරීම, මැදිරි හා කාර්යාලවල තිර රෙදි හා සිග්නල් කොඩිවල මැහුම් වැඩ හා ඇඳන් හා පුටු කුෂන් කිරීම
07	මූලික තාක්ෂණ ශිල්පී(වාත්තු)	දුම්රිය මාර්ග, පාලම් හා ගොඩනැගිලි අළුත්වැඩියා කිරීමේදීත්, දුම්රිය ධාවනයට අවශ්‍ය එන්ජින්, ගැල් හා මැදිරි, යන්ත්‍ර සූත්‍ර නඩත්තුවට අවශ්‍ය අමතර කොටස් නිෂ්පාදනය කිරීම, නිෂ්පාදනයට සහාය වීම, යන්ත්‍ර සූත්‍ර පිරිසිදුව තබා ගැනීම මෝස්තර සැකසීම, එම ලේඛන ගබඩා කර තබා ගැනීම, වාත්තු අව්වු සැකසීම, පිරිසිදු කිරීම, ලෝහ උණු කිරීම, වැක්කිරීම, යන්ත්‍ර සූත්‍රවලට අවශ්‍ය තෙල්, ග්‍රීස් ආදිය යෙදීම හා සියළුම ආකාරයේ නඩත්තු කටයුතු
08	මූලික තාක්ෂණ ශිල්පී(කම්මල්)	

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

අනු. අංකය	*තනතුර*	*තනතුරට පැවරෙන කාර්යයන්*
09	මූලික තාක්ෂණ ශිල්පී (ප්‍රගති)	දුම්රිය එන්ජින්, ගැල් හා මැදිරි, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තුව හා අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන අමතර කොටස් හා අමුද්‍රව්‍ය ඇණවුම් තිබීම හා සැපයීමේ කාර්යයන් සොයා බලා අදාළ අංශවල සම්බන්ධීකරණය පවත්වා ගැනීමෙන් එම කාර්යයන්හි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම

(4). **පුහුණු කාල සීමාවට බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

4.1 **අධ්‍යාපන සුදුසුකම් :**

(a.) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අ.පොෙ.ස. (සා/පෙළ) විභාගය සමත් වී තිබීම.
(ක්ෂේත්‍රයට අදාළ NVQ 3 හෝ ඊට ඉහළ සුදුසුකම් ලබා ඇති නිළධාරීන් ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති ලෙස සලකනු ලැබේ.)

4.2 **වෘත්තිය සුදුසුකම් :**

තනතුරු නාමය	*වෘත්තිය සුදුසුකම්*	*පුහුණු කාලය*
මූලික තාක්ෂණ ශිල්පී (කම්බිකරු)	තෘතියික හා වෘත්තීය පුහුණු අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු NVQ 03/04 මට්ටමේ කාර්මික පාඨමාලාවක් හදාරා සහතික පත්‍ර ලබා ඇති අයෙකු වීම	අවුරුදු 01
මූලික තාක්ෂණ ශිල්පී (පිංතාරු)		
මූලික තාක්ෂණ ශිල්පී (බෙලෙක් වැඩ)		
මූලික තාක්ෂණ ශිල්පී (පොරාදු)		
මූලික තාක්ෂණ ශිල්පී (වාත්තු)		
මූලික තාක්ෂණ ශිල්පී (ප්‍රගති)		
මූලික තාක්ෂණ ශිල්පී (කම්මල්)		
මූලික තාක්ෂණ ශිල්පී (වඩු)	මු.තා.ශි.(වඩු හා පෙදරේරු) තනතුරු සඳහා තෘතියික හා වෘත්තීය පුහුණු අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් මාස 06කට නොඅඩු NVQ 03/04 මට්ටමේ කාර්මික පාඨමාලාවක් හදාරා සහතික පත්‍ර ලබා ඇති අයෙකු වීම.	
මූලික තාක්ෂණ ශිල්පී (පෙදරේරු)		

4.3 **පළපුරුද්ද :**

අදාළ නොවේ

4.4 **කායික සුදුසුකම්**

I. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර, දුම්රිය රෙගුලාසි මාලාවේ දක්වා ඇති අක්ෂි දෘෂ්ඨියක් සහිත විය යුතු ය.

4.5 **වෙනත් සුදුසුකම් :**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය;

ii. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය;

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* වෙබ් අඩවියේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දින වන 2026.12.14 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු යි.

4.6 **වයස් සීමාව :**

(a). අයදුම්පත් කැඳවීමේ අවසන් දිනයට අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය.

5). **බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලිඛිත තරග විභාගයකයට හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමුකර ලිඛිත තරග විභාගයේ සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලැබූ අයගේ කුසලතා අනුපිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව ප්‍රථමයෙන් වසරක පුහුණු කාල සීමාවකට බඳවා ගනු ලබයි. සම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩුව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය වේ.

පුහුණුව අවසානයේ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කර සමත් වූ අය මූලික තාක්ෂණ ශිල්පී තනතුරුවල III වන ශ්‍රේණියට පත්කරනු ලැබේ. පළමුවර පුහුණුව අවසන් පරීක්ෂණය අසමත් වූ අයට, නැවත පැවැත්වෙන පුහුණුව අවසන් පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථා 02 ක් ලබාදෙන අතර, ඉන් අසමත් වන අයගේ සේවය අවසන් කරනු ලැබේ.

(6) **වැටුප් පරිමාණය :**

පුහුණු කාල සීමාවෙන් පසු III ශ්‍රේණිය සඳහා

මෙම තනතුරුවලට අදාළව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන I අනුව අදාළ වැටුප් පරිමාණය (MT-01-2025) රු.50,090-10X540-11X630-10X1010-10X1,190-84,420/- වේ.ඔබට වැටුප් ගෙවනුයේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන හි III සඳහන් පරිදි වේ.මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

පුහුණු කාල සීමාව සඳහා

මාසික දීමනාව - 2026.12.31 දින දක්වා මාසික දීමනාව රු. 38,863/-කි. 2027.01.01 දින සිට මාසික දීමනාව - රු. 40,000/- කි.

(7). **විභාග ගාස්තුව :**

මෙම විභාගය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් නියම කරනු ලබන ආයතනය මගින් කොළඹ දී පවත්වනු ලැබේ. විභාග ගාස්තුව රු. 1,200/- කි. විභාග ගාස්තුව දුම්රිය සාමාන්‍යාධිකාරිගේ මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-100129027-313 ට බැර වන ලෙස අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවා අයදුම්කරුගේ නම්න්ම ලබා ගන්නා රිසිටි පත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන සේ අලවන්න. එම රිසිටි පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

1. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.
2. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

(8). **අයදුම් කිරීමේ ක්‍රමය :**

(අ) අයදුම්පත මෙම නිවේදනයේ අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. එය කඩදාසිය දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සෙ.මී.29.5 X 21 ප්‍රමාණයේ A4 කඩදාසියක සකස් කර තම අත් අකුරින් පිරවිය යුතු ය. අංක 01 සිට 2.4 තෙක් ශීර්ෂ පළමු වන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලට ද වන ලෙස ගෙන අයදුම්පත සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිත කළ හැකිය. සම්පූර්ණ කරනු ලැබූ අයදුම්පත කැඳවීම් නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින් අයදුම්පත යොමු කිරීමට පෙර එය කැඳවීම් නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතු ය.

(*ආ*) අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව, ඉංග්‍රිසි භාෂාවෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(*ඇ*) අයදුම්පත දුම්රිය සාමාන්‍යාධිකාරිගේ හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අන්‍ය නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ - 03 සේවා ගණයේ මූලික තාක්ෂණ ශිල්පි 111 ශ්‍රේණියේ තනතුරු වලට විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා වන පුහුණු කාලයට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2026 "**යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(*ඉ*) **අයදුම්පත් 2026.12.14 වැනි දිනට** හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දුම්රිය සාමාන්‍යාධිකාරි,
දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය,
තැ.පෙ.355,
ඕල්කට් මාවත,
කොළඹ 10.

(*ඊ*) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

9) විභාගයට ඇතුළුවීම :

(*අ*) මෙම ලිඛිත විභාගය පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් නියම කරනු ලබන ආයතනය විසින් කොළඹ දී පවත්වනු ලැබේ. *ගැසට්* නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ට පමණක් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(*ආ*) අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අයදුම්කරුවකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවා ගෙන පළමුවෙන් එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතු ය. අයදුම්කරු තම අයදුම්පත්‍රයේ සඳහන් කළ ජාතික හැඳුනුම්පත් අංකයම විභාග ශාලාවේදී ද යෙදිය යුතු වන අතර, යම් හෙයකින් වෙනත් අංකයක් ඇතුළත් කර තිබුණහොත් එම අයදුම්කරුගේ ප්‍රතිඵල අත්හිටවනු ලැබේ. සෑම අයදුම්කරුවකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අයදුම්කරුවන් යටත්වේ. එම නීති උල්ලංඝනය කළහොත් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදුවනු ඇත.

(*ඇ*) **අත්සන සහතික කිරීම :**

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු/ විශ්‍රාමික නිලධාරියෙකු / කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයා/ සාමදාන විනිශ්චයකාරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු/රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති/ නායක ස්වාමීන් වහන්සේ නමක්/ අන්‍ය ආගමික පූජ්‍යස්ථානයක භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු ලවා සහතික කරවා ගත යුතු ය.

සටහන :- අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10) අයදුම්කරුගේ අනන්‍යතාව :

අපේක්ෂකයන් විසින් තමන් ඉදිරිපත් වන එක් එක් විෂයය සඳහා විභාග ශාලාධිපති වෙත තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන්

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

11) සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම :

(i.) මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර හෝ අවස්ථාවක දී වුව ද ඇයගේ හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

(ii.) අපේක්ෂකයකු විසින් සපයනු ලබන තොරතුරු පසු කලෙක දී වැරදි බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහු හෝ ඇය වෙත පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් තව දුරටත් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතු කොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

12) විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :

මෙම විභාගය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් නියම කරන ආයතනයක් මගින් කොළඹ දී පමණක් පැවැත්වේ.

12.1 ලිඛිත විභාග මාධ්‍යය -

විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

සටහන : (a.) අයදුම්කරුවකු විභාගයේ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකට ම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

(b.) තම අයදුම්පතෙහි සඳහන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අයදුම්කරුවකුට අවසර දෙනු නොලැබේ.

12.2 ලිඛිත විභාග ප්‍රතිඵල :

ලිඛිත විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ.

12.3 ලිඛිත විභාගය පිළිබඳ විස්තර :

පුහුණු කාලසීමාවට බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගය

විෂයය	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
සාමාන්‍ය දැනීම	පැය 01	100	40%
බුද්ධි පරීක්ෂණය	පැය 01	100	40%

12.4 ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :

★. **සාමාන්‍ය දැනීම**

ශ්‍රී ලංකාවේ සමාජ, දේශපාලන, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන්ද අපේක්ෂකයාගේ සාමාන්‍ය දැනීම පිරික්සීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි.

★. **බුද්ධි පරීක්ෂණය**

අපේක්ෂකයාගේ තර්කානුකූල විශ්ලේෂණ ශක්තිය ද, ක්ෂණිකව තීරණ ගැනීමේ හැකියාව ද, තක්සේරු කිරීමට හැකිවන අයුරු, සංඛ්‍යාමය ගැටළු හා භාෂා බණ්ඩ, වගු යනාදිය ඇතුළත්ව පින්තූර හා ප්‍රස්ථාර උපයෝගි කර ගනිමින් බහුවරණ ක්‍රමයට සැකසුණු ප්‍රශ්න පත්‍රයකි.

13) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

ලිඛිත තරග විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කර ලිඛිත විභාගයෙන් හා යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල කුසලතා **අනුපිළිවෙළ අනුව අයදුම්පත් කැඳවන අවස්ථාවේ පැවැති පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.**

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

අනු. අංකය	*ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර*	*සලකා බැලෙන උප ක්ෂේත්‍ර*	*ලබා දෙන ලකුණු ප්‍රමාණය*	*උපරිම ලකුණු ප්‍රමාණය*
1	අතිරේක අධ්‍යාපන සුදුසුකම්	අ.පොස. උ.පෙළ විභාගයේ දී සමත් වී ඇති විෂයයක් සඳහා ලකුණු 01 බැගින් ද, සම්මාන සාමාර්ථ ලබා සමත් වී ඇති විෂයයක් සඳහා ලකුණු 02 බැගින් වන සේ විෂයයන් 03 ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. (ඉංග්‍රීසි භාෂාව හා සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)	6	20
		ඉංග්‍රීසි විෂයය සම්බන්ධයෙන් ලබා ඇති සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා	5	
		පරිගණක හැකියාව සම්බන්ධයෙන් ලබා ඇති සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා	5	
		වෙනත් භාෂාවක් සම්බන්ධයෙන් ලබා ඇති සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා	4	
2	අතිරේක වෘත්තීය සුදුසුකම්	**තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති නිපුණතාවය පිළිබඳ සලකා බලනු ලැබේ. (මූලික වෘත්තීය සුදුසුකම් සඳහා ලකුණු ලබා දීමක් සිදු නොවේ.)**	ලකුණු	30
		ක්ෂේත්‍රයට අදාළ පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 6 පාඨමාලාවන් සඳහා	10	
		ක්ෂේත්‍රයට අදාළ පිළිගත් ආයතනයකින් ලබාගත් වසර 1 පාඨමාලාවන් සඳහා	20	
		ක්ෂේත්‍රයට අදාළ පිළිගත් ආයතනයකින් ලබාගත් වසර 1 වැඩි පාඨමාලාවන් සඳහා	30	
3	තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද	**තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද සලකා බලනු ලැබේ.**	ලකුණු	30
		සේවා පළපුරුද්ද වසර 03 හෝ ඊට වැඩි නම් එක් සේවා සහතිකයකට ලකුණු 15 බැගින් සේවා සහතික දෙකක් (2) සඳහා	30	
		සේවා පළපුරුද්ද වසර 02 හෝ ඊට වැඩි හෝ 03 ට අඩු නම් එක් සේවා සහතිකයකට ලකුණු 10 බැගින් සේවා සහතික දෙකක් (2) සඳහා	20	
		සේවා පළපුරුද්ද වසර 01 හෝ ඊට වැඩි හෝ 02 ට අඩු නම් එක් සේවා සහතිකයකට ලකුණු 5 බැගින් සේවා සහතික දෙකක් (2) සඳහා	10	
		සේවා පළපුරුද්ද මාස 06 හෝ ඊට වැඩි හෝ වසර 01 ට අඩු නම් එක් සේවා සහතිකයකට ලකුණු 2.5බැගින් සේවා සහතික දෙකක් (2) සඳහා	5	
4	විශේෂ/බාහිර දක්ෂතා	ක්‍රීඩා/ශිෂ්‍යභට ආදී කුසලතා සම්බන්ධයෙන් ලබා ඇති පිළිගත හැකි සහතිකපත් තුනකට ලකුණු 03 බැගින් උපරිම සහතික 03 ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.	9	15
		සෞන්දර්ය කුසලතා සම්බන්ධයෙන් ලබා ඇති පිළිගත හැකි සහතික එකක් සඳහා උපරිම එක් සහතිකයක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.	2	
		සමාජ සේවා කටයුතු සම්බන්ධයෙන්ලබා ඇති සහතික/දහම් පාසල් තරග විභාග සහතික එකක් සඳහා ලකුණු 1 බැගින් උපරිම සහතික 02 ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.	2	
		ඉහත ලකුණු සඳහා ඉදිරිපත් කර නොමැති වෙනත් බාහිර කුසලතාවක් සම්බන්ධයෙන් ලබා ඇති පිළිගත හැකි සහතික එකක් සඳහා	2	

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

අනු. අංකය	*ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර*	*සලකා බැලෙන උප ක්ෂේත්‍ර*	*ලබා දෙන ලකුණු ප්‍රමාණය*	*උපරිම ලකුණු ප්‍රමාණය*
5	සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ආකල්ප හා පෞරුෂය	සන්නිවේදනය	2	5
		සවන් දීම	2	
		පෞරුෂය	1	
		එකතුව		**100**

14. පුහුණු කාල සීමාවෙන් පසු III ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත විභාගයේ හා ප්‍රායෝගික පරීක්ෂණය

14.1 පුහුණු කාල සීමාවෙන් පසු III ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත විභාගයේ විෂයයන්

විෂයය	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
තාක්ෂණ විෂය	පැය 02	100	40%

විෂය නිර්දේශය :

තාක්ෂණ විෂය: තනතුරට අදාළව දැනගත යුතු මූලික තාක්ෂණ දැනුම මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

14.2 **පුහුණු කාල සීමාවෙන් පසු III ශ්‍රේණියට බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණය :**

විෂයය	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
තාක්ෂණ විෂයය	100	40%

විෂය නිර්දේශය :

තාක්ෂණ විෂයය:තෝරාගත් විෂය පිළිබඳ නිපුණතාවය මැන බැලීම සඳහා තනතුරට අදාළ තාක්ෂණ විෂය සම්බන්ධයෙන් වූ න්‍යායික දැනුම ප්‍රායෝගිකව නිවැරදි භාවිතයට ගනු ලබන්නේ දැයි මැන බැලීම සඳහා වන ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

15. සේවා කොන්දේසි :

මෙම තනතුර ස්ථීරය.විශ්‍රාම වැටුප් සහිත ය.

15.1 සේවා ගිවිසුම පිළිබඳ විස්තර :

පුහුණු කාලසීමාවකට බඳවා ගෙන III ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් III ශ්‍රේණියට පත්වීම් ලද දින සිට වසර 10 ක කාලයක් අනිවාර්යයෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතුය.එසේ වසර 10 සේවයට පෙර ඉවත්වන නොයන බවටත් ඊට පෙර සේවයෙන් ඉවත්ව යන්නේ නම් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් නිර්දේශ කරනු ලබන මුදලක් දෙපාර්තමේන්තුවට ගෙවීමට එකඟ බවටත් රජයේ සේවකයෙකු ඇපකරුවෙකු වශයෙන් ඉදිරිපත් කර වගකීමකට බැඳිය යුතු ය.

III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

15.2 රාජ්‍ය භාෂාව :

රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතු ය.

අනෙක් රාජ්‍ය භාෂාව: රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

තෝරා ගනු ලබන්නන් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක: PSC/EST/04-01-43/08/2016 හා 2017.09.07 දිනැතිව අනුමත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ-03 සේවා ගණය සඳහාවන බඳවා ගැනීමේ පටිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසි වලටද, එම පටිපාටියට කර ඇති හෝ මින් මතු කරන සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක : 2310/29 හා 2022.12.14 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසිවලට ද, යටත් විය යුතු ය. තෝරා ගනු ලබන්නන් නියමිත වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්වීමට අමතරව දුම්රිය දෙපාර්තමේන්තුවේ උපදෙස් මාලාවට අනුව තනතුරට අදාළව සමත්විය යුතු විශේෂ දෘෂ්ඨි පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

16). සිංහල හා දෙමළ මාධ්‍යන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර, කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

17). කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද දුම්රිය සාමාන්‍යාධිකාරිට බලය ඇත.

රවින්ද්‍ර පත්මප්‍රිය,
දුම්රිය සාමාන්‍යාධිකාරි.

2026 නොවැම්බර් මස 02 වැනි දින,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
ඕල්කට් මාවත,
තැ. පෙ. 355,
කොළඹ 10.

Gazette.lk AMBITIONS REALIZED